# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,237 - 2021 ජූලි මස 16 වැනි සිකුරාදා - 2021.07.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | -- |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | -- |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | -- |
| පළාත් සභා නිවේදන ... ... ... ... | -- |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | -- |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | -- |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1014 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | -- |
| විවිධ දැන්වීම් ... ... ... ... | -- |


*සැ. යු.* - (i) අධිකරණයට අපහාස කිරීමේ පනත් කෙටුම්පත 2021 ජූලි මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) මුදල් පනත් කෙටුම්පත 2021 ජූලි මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 අගෝස්තු මස 06 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජූලි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1013 - B 082250— 5,403 (2021/07)
F 1 -

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ආදායම් පරීක්ෂක සේවයේ III වන ශ්‍රේණිය සඳහා ආදායම් පරීක්ෂකවරුන් බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2021

මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනවල පවතින ආදායම් පරීක්ෂක III වන ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සඳහා මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචි සුදුසුකම් ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

*විභාගය* - සුදුස්සන් තෝරා ගැනීම සඳහා වන විභාගය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සංවිධානය කර හෝ කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ. මෙම විභාගය මහනුවර නගරයේ දී පැවැත්වීමට අපේක්ෂා කරනු ලැබේ.

01. පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය - පත්වීම ක්‍රියාත්මක වන දිනය පළාත් පාලන කොමසාරිස් විසින් නිශ්චය කරනු ලැබේ.

02. *සේවා කොන්දේසි.-*

(i) මධ්‍යම පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක සේවයට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ පනවා ඇති කොන්දේසිවලට ද එම පරිපාටියට කර ඇති හෝ මින් මතුවට කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ii) මෙම තනතුර ස්ථිරය./විශ්‍රාම වැටුප් සහිත ය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් පත් කරනු ලබන දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව මෙම සේවයට පත් කරනු ඇත.

(iv) පරිවාස කාලය අවසානයේ දී තනතුරුවලට ස්ථිර කරනු ලැබීමට අපොහොසත් වුවහොත් ඔහුගේ/ඇයගේ සේවය අවසන් කිරීමට සිදුවනු ඇත.

(v) රා.ප.ච.ලේ. 18/2020 විධිවිධාන අනුව සියලුම නිලධාරින් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 03ක් තුළ ලබාගත යුතුය. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ප්‍රාරම්භක කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. (ලබාගත යුතු ප්‍රවීණතා මට්ටම 03 වන කාණ්ඩය). පත්වීම දින සිට වසර 03ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාවය ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබාගන්නා තෙක් නතර කරනු ඇත.

(vi) තෝරාගනු ලබන නිළධාරීන් මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත්වන අතර, තුන් අවුරුදු පරිවාස කාලය නිමාවන තුරු ස්ථාන මාරු කිරීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

(vii) ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, පළාත් සභා මුල්‍ය රීති, දෙපාර්තමේන්තු නියෝග හා විටින් විට රජය හා මධ්‍යම පළාත් සභාව විසින් නිකුත් කරන නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(viii) ක්ෂේත්‍ර රාජකාරී කයුතුවල නිරත වන අවස්ථාවන්හි දී අංග සම්පූර්ණ නිල ඇඳුමෙන් සැරසී සිටිය යුතු වේ.

(ix) දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නියම කරනු ලැබුවහොත් ගමන් බිමන් යාම සඳහා යතුරු පැදියක් තබා ගත යුතු ය.

දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නියම කරනු ලැබුවහොත් විශේෂ උත්සව සැණකෙළි වැනි අවස්ථාවන් හි දී ආදායම් රැස්කිරීම/අධීක්ෂණය කිරීම සඳහා දිවා රාත්‍රී දෙකෙහිම වුව ද සේවයේ නිරත විය යුතු වේ.

03. *වැටුප් පරිමාණය.-* ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණියට අයත් ඒකාබද්ධ වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි කේත අංක එම්එන් 01-2016 අනුව මාසිකව රු. 27,140-10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45540/- වේ.

04. *සුදුසුකම්.-*

1. *මූලික සුදුසුකම්.-*

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ආ) **2021.07.31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතු ය.** දැනටමත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව බලනොපැවැත් වේ.

(ඇ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

(ඈ) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසරයක් නොමැත.

(ඉ) අයදුම්කරුවන් මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03ක කාලය තුළ ස්ථිර පදිංචිය සම්මුඛ පරීක්ෂණයේ දී ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතු ය.)

(ඊ) අයදුම්කරුවන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ උසාවියකින් දඬුවම් නොලැබූ අයෙකු විය යුතු ය.

*සටහන.-* මෙම විභාගය සඳහා තරග කරන අපේක්ෂකයන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් සියලු සුදුසුකම් අයදුම්පත් බාරගන්නා අවසන් දින වන විට සම්පූර්ණ කර තිබිය යුතු ය. ඊට අදාළ වන සියලු සහතික හා ලියවිලි පළාත් පාලන කොමසාරිස් ඉල්ලූ වහාම ඉදිරිපත් කිරීම සඳහා සූදානම්ව තබාගත යුතු ය. විභාගයක ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉල්ලුම්කළ නොහැක.

05. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.-*

*විවෘත බඳවා ගැනීම :-*

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය යන විෂයයන් ඇතුළුව තවත් විෂයයන් 02කට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06)කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ).

*සහ*

(ii) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සමත්ව තිබීම.

*සීමිත බඳවා ගැනීම.-*

(i) සිංහල/දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව හා ගණිතය ඇතුළුව අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් (06) සමත්වීම.

*සහ*

(ii) මධ්‍යම පළාතේ පළාත් පාලන සේවයේ ප්‍රාථමික සේවා ගණයට අදාළ ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය හෝ ශිල්පීය ශ්‍රේණියක වසර 10කට වඩා වැඩි සක්‍රීය, සතුටුදායක හා ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සතුටුදායක සේවා කාලය යන්නෙන්, අදාළ කාලය තුළ සාමාන්‍ය මට්ටමේ කාර්යය සාධනයක් පෙන්නුම් කර තිබෙන්නා වූ ද, අත්හිටුවීමක් හෝ නතර කිරීමක් හෝ කල් දැමීමක් හෝ විලම්බනය කිරීමක් සිදු නොවී, නියමිත පරිදි පූර්වාසන්න වසර 05 තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබෙන සහ අවවාද කිරීමක් හැර, වෙනත් යම් ආකාරයක විනයානුකූල දඬුවමකට යටත් නොවී ඇත්තා වූ ද සේවා කාලයක් වේ.

06. *විභාග ගාස්තු.-* මෙම විභාගය සඳහා ගාස්තුව රු. 600.00 කි. එම මුදල මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13ට බැර වන පරිදි අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට ප්‍රථම මධ්‍යම පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා එවිය යුතු ය. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ.

(මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.) තව ද, විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

07. *අයදුම් කිරීමේ ක්‍රමය.-*

*(අ)* (අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කරමින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර, අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතු ය. අංක 01 සිට 02 තෙක් ශීර්ෂ පළමු පිටුවට ද, 03 සිට 05.ii තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද, 5.iii සිට 10 තෙක් ශීර්ෂ තුන්වන පිටුවට හා 11 සිට 13 වන ශීර්ෂය හතරවන පිටුවට ද, ඇතුළත්වන පරිදි අයදුම්පත්‍රය සකස් කරගත යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

*(ආ)* විවෘත/සීමිත තරග විභාගය සඳහා වූ අයදුම්පත **2021.08.16** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "**පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ, කුණ්ඩසාලේ**" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**ආදායම් පරීක්ෂක III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2021**" යන වගන්තිය පැහැදිලි ලෙස ලිවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ. රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය.

*(ඇ)* සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම පිළිබඳව මෙම දෙපාර්තමේන්තුව වග කියනු නොලබන අතර, ඒ සම්බන්ධයෙන් කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. තව ද, ඔහු/ඇය විභාගයට ඇතුළත් කර ගැනීමට එය යෝග්‍ය පිළිගැනීමක් බවට පත් නොවේ.

*(ඈ)* ඔබ අයදුම් කරනු ලබන්නේ විවෘත පදනම යටතේ ද සීමිත පදනම යටතේ ද යන්න අයදුම්පතෙහි පැහැදිලිව සඳහන් කළ යුතු ය.

*(ඉ)* අයදුම් කරන දිස්ත්‍රික්කය ලෙස සඳහන් කළ යුත්තේ අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකයයි.

| | | |
|---|---|---|
| මහනුවර - 01 | මාතලේ - 02 | නුවරඑළිය - 03 |

*(ඊ)* විභාග ඉල්ලුම්පත්‍රයේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කිරීමට බලයලත් අයෙකු විසින් අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතු ය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු ලවා ද, අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, රු. 240,360/-ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

*සටහන.-* විභාග ගාස්තු ගෙවන ලද ලදුපත හැර වෙනත් කිසිදු ලියවිල්ලක් හෝ පිටපතක් **අයදුම්පත්‍රය සමග ඇමිණීම සිදු නොකළ යුතු ය.**

08. *විභාගයට ඇතුල්වීම.-*

*(අ)* නිසි ලෙස අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත මධ්‍යම පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව/විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී ම විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේ දී ම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

*(ආ)* සෑම අපේක්ෂකයෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රයේ පළකර ඇත.

*(ඇ)* අපේක්ෂකයෙකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

*(ඇ)* විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනු ඇත.

09. *අපේක්ෂකයාගේ අනන්‍යතාව* -

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පුකර සිටිය යුතු ය. මේ සඳහා පහත ලේඛන පමණක් පිළිගනු ඇත.

*(අ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,
*(ආ)* ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති වලංගු විදේශ ගමන් බලපත්‍රය,
*(ඇ)* වලංගු රියැදුරු බලපත්‍රය.

10. *සාවද්‍ය තොරතුරු සැපයීම.*-

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් වුවමනාවෙන්ම යටපත් කර ඇති නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

11. *පරීක්ෂා කිරීමේ ක්‍රමය හා විෂයය නිර්දේශය :*

i. *විවෘත තරග විභාගයේ විෂයය නිර්දේශය* -

පහත සඳහන් විෂයයන් සඳහා පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයක් මගින් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

| *විෂයය* | *විෂයය නිර්දේශය* | *කාලය (පැය)* | *මුළු ලකුණු* |
|---|---|---|---|
| භාෂා හැකියාව | මෙම ප්‍රශ්නපත්‍රය අපේක්ෂකයාගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කරන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. | 1 1/2 | ලකුණු 100 |
| අභියෝග්‍යතාවය | මෙම ප්‍රශ්නපත්‍රය අපේක්ෂකයාගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය, මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. | 01 | ලකුණු 100 |

ii. *සීමිත තරග විභාගයේ විෂයය නිර්දේශය.-*

පහත සඳහන් විෂයයන් සඳහා පැවැත්වෙන ලිඛිත පරීක්ෂණක් මගින් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

| *විෂයය* | *විෂයය නිර්දේශය* | *කාලය (පැය)* | *මුළු ලකුණු* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයන්ගේ තර්කානුකූල ශක්තිය විශ්ලේෂණය හා සංස්ලේෂණ හැකියාව, ඉක්මන් හා නිවැරදි තීරණ ගැනීමේ හැකියාව මැනෙන පරිදි සකස්වන විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයකි. | 1 1/2 | ලකුණු 100 |
| සාමාන්‍ය දැනීම | දේශීය හා විදේශීය වශයෙන් වැදගත්වන කාලීන සිද්ධීන් පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම මැනීමට සකස්වන විෂයානුබද්ධ ප්‍රශ්නපත්‍රයකි. | 01 | ලකුණු 100 |

විභාගය සමත් වීමට ලිඛිත පරීක්ෂණයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා නියමිත ලකුණු සංඛ්‍යාවෙන් සියයට හතළිහක (40%) අවම ලකුණු ප්‍රමාණයක් ද, මුළු විභාගය සඳහා අවම වශයෙන් සියයට පනහක (50%) සාමාන්‍යයක් ද ලබා ගන්නා අපේක්ෂකයන්ගෙන් ලබාගත් ලකුණු අනුපිළිවෙල මත පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබීමට යෝග්‍ය වන අතර, ලිඛිත පරීක්ෂණයෙන් පසු දැනුම් දෙනු ලබන දිනයක දී සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කිරීමට සහ සේවා වාර්තා පරීක්ෂා කර බැලීම සඳහා වන අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

12. *පත් කිරීම පිණිස තෝරාගැනීමේ ක්‍රමය.-*

පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් සියයට හැත්තෑවක් (70%) විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත ද, සියයට තිහක් (30%) සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත ද බඳවා ගනු ලැබේ. තරග විභාගයේ ප්‍රතිඵලවල ලකුණු ප්‍රමුඛතාව පරිදි කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් සනාථ කර ගැනීමෙන් පසු බඳවා ගැනීම සම්බන්ධ රජයේ ප්‍රතිපත්ති හා නියමයන් අනුගමනය කරමින් පුරප්පාඩු පුරවනු ලැබේ. පත්වීම් ප්‍රදානයේ දී අවසන් ලකුණුවලට සමාන කිහිප දෙනෙකු සිටින අවස්ථාවක දී, අධ්‍යාපන සුදුසුකම් හා ක්ෂේත්‍රයට අදාළ වෘත්තීය සුදුසුකම් අනුව, ඉහළම සුදුසුකම් ඇති පුද්ගලයා සම්මුඛ පරීක්ෂණයේ දී තෝරාගැනේ. මෙහි දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි සඳහන් විධිවිධාන අනුව දිස්ත්‍රික් ජන අනුපාතය යටතේ බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

13. 10 (ආ) ඡේදය අනුව සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/විභාග කොමසාරිස් ජනරාල් විසින් අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව තැපැල මගින් දන්වා යැවීම හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය ඔස්සේ සිදු කරනු ඇත. (www.psc.cp.gov.lk).

14. ඉහත රෙගුලාසිවලින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් මතුවන ගැටලු පිළිබඳව මධ්‍යම පළාත් පාලන කොමසාරිස්ගේ තීරණය, අවසන් තීරණය වනු ඇත.

15. මෙම නිවේදනයේ සිංහල හා දෙමළ පරිවර්තන අතර කිසියම් අනනුකූලතාවයක් පවතින්නේ නම් සිංහල නිවේදනයේ ඇතුළත් කරුණු බල පවත්වන්නේ ය.

එච්. එම්. එම්. යූ. බී. හේරත්,
පළාත් පාලන කොමසාරිස්.

2021 ජූලි මස 07 වැනි දින,
පළාත් සභා සංකීර්ණය,
පල්ලේකැලේ, කුණ්ඩසාලේ
පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දී ය.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ආදායම් පරීක්ෂක සේවයේ III වන ශ්‍රේණිය සඳහා ආදායම් පරීක්ෂකවරුන් බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2021

අයදුම්කරන දිස්ත්‍රික්කය හා කේන්ද්‍ර අංකය :

අයදුම් කරන්නේ සීමිත/විවෘත : සීමිත - L/ විවෘත - O)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය : සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E

01. (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..........
(උදා. : PERERA A. B. C.)

(ii) මුලකුරුවලින් කියවෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : ..........

02. (i) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........

(ii) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ..........

(iii) රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........

(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිළධාරියෙකු ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය ලිවිය යුතුය.)

(iv) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- ..........

(v) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- ..........

(vi) මධ්‍යම පළාත තුළ පදිංචි කවදා සිට ද ? :- ..........

03. (i) ස්ත්‍රී/පුරුෂ භාවය - (පුරුෂ - M, ස්ත්‍රී - F)

(ii) ජාතික හැඳුනුම්පත් අංකය :

(iii) විවාහක අවිවාහක : (විවාහක - M, අවිවාහක - S)

(iv) දුරකථන අංකය :..............................................................................

(v) උපන් දිනය : අවුරුද්ද :......................... මාසය :..................... දිනය :.......................

(vi) 2021.07.31 දිනට වයස : අවුරුදු :......................... මාස :......................... දින :.........................

04. ජන වර්ගය : ........................................................................................................

05. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :*

(i) අ.පො.ස. (සා.පෙළ) විභාගය :

වර්ෂය :...............................

විභාග අංකය :......................................

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

වර්ෂය :.....................................

විභාග අංකය :.....................................

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(ii) අ.පො.ස. (උ.පෙළ) විභාගය :

වර්ෂය :...............................

විභාග අංකය :.....................................

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

(iii) ලබාගෙන ඇති උපාධිය/ඩිප්ලෝමාව පිළිබඳ විස්තරය :

| *සමත් වූ උපාධිය/ඩිප්ලෝමාව* | *විශ්වවිද්‍යාලය/ආයතනය* | *උපාධිය/ඩිප්ලෝමාව වලංගු දිනය* |
|---|---|---|
| | | |
| | | |

06. වෙනත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :- ..........................................................................................................
..........................................................................................................

07. (i) ඔබ කිසියම් සාපරාධී වරදකට උසාවියකින් දඬුවම් ලබා තිබේ ද? ඔව්/නැත ..........................................................

(ii) 'ඔව්' නම් විස්තර සඳහන් කරන්න. ..........................................................................................................

08. අයදුම්කරු දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කරන්නේ නම්,

(i) දැනට දරන තනතුර : ..........................................................................................................
(ii) දැනට සිටින ශ්‍රේණිය : ..........................................................................................................
(iii) සේවය ස්ථිර කර ඇත් ද? එසේ නම් ස්ථිර කළ දිනය : ..........................................................
(iv) සේවා ස්ථානයේ නම හා ලිපිනය :..........................................................................................................
(v) සේවා ස්ථානයේ දුරකථන අංකය :..........................................................................................................

09. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේ ද?....................................................
එසේ නම්,

| *වර්ෂය* | *කාර්ය සාධන මට්ටම* | *වැටුප් වර්ධක ලබා ඇත/නැත/විලම්බනය වී ඇත* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

10. (i) විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය හා දිනය : ..........................................................................................................
(ii) ලදුපත ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ..........................................................................................................

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

11. *අයදුම්කරුගේ සහතිකය.-*

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම් පිළිබඳව පනවා ඇති කොන්දේසි අනුව ම'විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් විභාගයට පෙර හෝ පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත් තෝරාගැනීමෙන් පසුව ඒ බැව් හෙළිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් දනිමි.

දිනය : ..........................  ..........................................................
අයදුම්කරු/අයදුම්කාරියගේ අත්සන.

12. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..........................................................................................මහතා/මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී .............................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අයදුම්පත්‍රයට නිවැරදිව අලවා ඇති බව ද සහතික කරමි.

දිනය : ......................

......................................................
සහතික කරන්නාගේ අත්සන.

නම : .......................................................................................................................
තනතුර : ...................................................................................................................
දිනය : .....................................................................................................................
(නිල මුද්‍රාව තබන්න.)

(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණක් අදාළ වේ.)

13. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................................................................................ මයා/මිය/මෙනෙවිය............................................................... වශයෙන් .........................................දින සිට ................................................................හි සේවය කරන බවත් මෙම අයදුම්පත්‍රයෙහි සපයා ඇති සියලුම තොරතුරු ඔහුගේ/ඇයගේ පුද්ගලික ලිපිගොනුව/සේවා වාර්තා සමග සන්සන්දනය කළ බවත්, ඒවා නිවැරදි බවත් මෙයින් සහතික කරමි. දැනට ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක වන අතර, පසුගිය ආසන්නතම වසර 05ක කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, මධ්‍යම පළාත් ආදායම් පරීක්ෂක තනතුරට අයදුම් කිරීමට ඔහුට/ඇයට සියලුම සුදුසුකම් තිබෙන බවත් පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

.................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය : ........................................
නම : ..........................................................................................................
තනතුර : ......................................................................................................
(නිල මුද්‍රාව තබන්න.)

07-406

---

## පළාත් පාලන දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීමේ සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ අයදුම්පත් කැඳවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,223 හා 2021.04.09 දින *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසෙහි පලකරන ලද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීමේ සේවයේ තනතුරුවලට බඳවා ගැනීමේ අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 8 (ii) ඡේදයේ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වශයෙන් සඳහන් **2021.05.10 දිනය 2021.07.30** දින දක්වා දීර්ඝ කරන බව දැනුම් දෙමි.

එච්. එම්. එම්. යූ. බී. හේරත්,
පළාත් පාලන කොමසාරිස්,
මධ්‍යම පළාත.

07-364

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.